# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2046/58 - 2017 නොවැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2017.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### සබරගමුව පළාතේ පළාත් සභාව

2009 අංක 04 හා 2009 අංක 07 දරන විසර්ජන ප්‍රඥප්ති මගින් සංශෝධනය වූ 2008 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය සඳහා වූ

**විසර්ජන ප්‍රඥප්තිය 2017**

**2009 වර්ෂය සඳහා**

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාව,*

*සබරගමුව පළාතේ පළාත් සභාවේ 2017 අංක 09 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය*

2017.09.26 වැනි දින සබරගමුව පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා විසින් සහතිකය සටහන් කරන ලදී.

2017.10.31 වැනි දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලදී.

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

*සබරගමුව පළාතේ පළාත් සභාවේ 2017 අංක 09 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය*

2017.09.26 වන දින සභා සම්මත කරන ලදුව 2017.10.31 වන දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලද සබරගමුව පළාත් සභාවේ 2017 අංක 09 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

පී. එස්. ආර්. එම්. විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 නොවැම්බර් මස 14 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ පළාත් සභාවේ, 2009 අංක 04 හා 2009 අංක 07 දරන විසර්ජන ප්‍රඥප්ති මගින් සංශෝධනය වූ 2008 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය සඳහා වූ විසර්ජන ප්‍රඥප්තිය**

01. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාත් සභාවේ 2017 අංක 09 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

02. 2009 අංක 04 හා 2009 අංක 07 දරන විසර්ජන ප්‍රඥප්ති මගින් සංශෝධනය වූ 2008 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තියෙහි දෙවන උප ලේඛනයෙහි සඳහන් 8102, 8103, 8332 හා 8333 යන අත්තිකාරම් ගිණුම් වල සීමාවන්, මෙහි පළමු උප ලේඛනය පරිදි සංශෝධනය කරනු ලැබේ.

*පළමු උපලේඛනය*

**2009 - ඇස්තමේන්තු**

***වෙනත් අත්තිකාරම් ගිණුම් කටයුතු***

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | *අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු* | *විෂය අංකය* | *අත්තිකාරම් වර්ගය* | *උපරිම වියදම් සීමාව* | *අවම ලැබීම් සීමාව* | *හර ශේෂයේ උපරිම සීමාව* | *බැරකම් වල උපරිම සීමාව* |
| | **වෙනත් අත්තිකාරම් ගිණුම් :** | | | | | | |
| 27. | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළෙඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබ සාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | 8102 | මුද්‍රණාල අත්තිකාරම් ගිණුම | 2,550,000 | 1,000,000 | 2,800,000 | 500,000 |
| 28. | නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර සහ ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය | 8103 | පරිගණක ව්‍යාපෘතිය | 800,000 | 275,000 | 290,000 | 50,000 |
| 29. | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 8332 | පේෂ කර්ම වැඩපළවල් පිහිටුවීම හා පරිපාලනය | 10,000,000 | 8,000,000 | 2,080,000 | 941,000 |
| 30. | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 8333 | කුඩා කර්මාන්ත වැඩපළවල් පිහිටුවීම හා පරිපාලනය | 10,000,000 | 2,046,000 | 5,000,000 | 500,000 |

12 - 205

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.